ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>මාධ්‍ය ප්‍රකාශය</u>

# ශ්‍රී ලාංකික සිසුන් සඳහා ඉන්දීය රජයේ ශිෂ්‍යත්ව

1. ඉන්දියානු රජය විසින් අ.පො.ස. උසස් පෙළ, උපාධි පාඨමාලා සහ ශ්‍රී ලංකාවේ රජයේ කාර්මික විද්‍යාලවල වෘත්තීය/තාක්ෂණික අධ්‍යාපනය සඳහා වතු කම්කරුවන්ගේ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පුළුල් කර ඇත. අ.පො.ස.සාමාන්‍ය පෙළ (අවම සාමාන්‍ය සාමාර්ථ 6ක් සහිත) හෝ උසස් පෙළ සමත් සහ වයස අවුරුදු 25ට අඩු සිසුන් මෙම ශිෂ්‍යත්වය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය දැන් අයදුම්පත් කැඳවයි. අයදුම්පත් www.hcicolombo.gov.in වෙබ් අඩවියෙන් බාගත කළ හැකි අතර නැතහොත් මහ කොමසාරිස් කාර්යාලයෙන් (අංක 36-38, ගාලු පාර, කොළඹ-03) සහ ඉන්දියානු සහකාර මහ කොමසාරිස් කාර්යාලයෙන් (01A, මහාමායා මාවත, තැපැල් පෙට්ටිය 47, මහනුවර) භෞතිකව ලබාගත හැකිය.

3. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර උප්පැන්න සහතිකයේ ඡායා පිටපත්, අ.පො.ස 'සා' පෙළ හෝ 'උසස්' පෙළ ප්‍රතිඵල පත්‍රය, දෙමාපියන්ගේ නවතම වැටුප් පත්‍රිකාව සහ දෙමාපියන්ගේ රැකියාව සම්බන්ධයෙන් වතු අධිකාරීවරයාගේ සහතිකය සමඟ ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලීම් කෙරේ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද පෝරම 2023 අප්‍රේල් 29 දිනට පෙර 'ගරු ලේකම්, CEWET ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය බාරේ, තැපැල් පෙට්ටිය 882, කොළඹ -03' වෙත භෞතිකව හෝ තැපෑලෙන් ඉදිරිපත් කළ හැක.

***

කොළඹ
2023 මාර්තු 31